**1990 සුවසැරිය පදනම - 2021**

**---------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1** මතය

--------

1990 සුවසැරිය පදනමේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ලාභ අරමුණු කර නොගත් සංවිධාන සඳහා නිර්දේශිත ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **මතය සඳහා පදනම**

---------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ලාභ අරමුණු කර නොගත් සංවිධාන සඳහා නිර්දේශිත ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය පදනම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ පදනමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, පදනම ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අප්‍රේල් 24 දින සෞඛ්‍ය අමාත්‍යාංශය හා GVK EMRI Lanka (Private) Ltd ආයතනය සමඟ අත්සන් කර තිබුණු අවබෝධතා ගිවිසුම හා 2018 අංක 18 දරන 1990 සුවසැරිය පදනම පනතේ 26 (ඇ) වගන්තිය ප්‍රකාරව, සුවසැරිය පදනමේ මෙහෙයුම් කටයුතු සඳහා වැය වන පුනරාවර්තන වියදම් රජය විසින් ප්‍රතිපූරණය කළ යුතු වුවද, 2021 දෙසැම්බර් 31 දින වන විට රජය විසින් ප්‍රතිපූරණය කර නොතිබුණු මුළු පුනරාවර්තන වියදම රු.330,091,526 ක් වූ අතර එම වියදම ප්‍රාග්ධන වියදම් සඳහා ලැබී තිබුණු අරමුදල්වලින් වැයකර තිබුණි. එසේම 2019 වර්ෂය සඳහා රජය විසින් පදනමට ලබාදී තිබුණු මූල්‍ය ප්‍රතිපාදනය 2021, 2022 හා 2023 වර්ෂවලදී පිළිවෙලින් සියයට 25 ක්, සියයට 50 ක් හා සියයට 75 ක් දක්වා අඩුකිරීමට 2019 අගෝස්තු 27 දින අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණු අතර මූල්‍ය ප්‍රතිපාදන අඩුකිරීමෙන් පසුව පදනම පවත්වාගෙන යාම සඳහා යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස දන්වා තිබුණි. නමුත් එවැනි යොජනාවක් 2022 මැයි 26 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණු අතර මෙම තත්ත්වය පදනමේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි ඍජු බලපෑමක් එල්ල විය හැකි බව නිරීක්ෂණය විය. | අදාළ සියලුම හිමිකම් හා ලිපි ලේඛන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති බව, අඛණ්ඩ වියදම් ප්‍රතිපූරණයකින් තොරව කාර්යක්ෂම මෙහෙයුමක් ක්‍රියාත්මක කිරීමේ දුෂ්කරතා පෙන්වා දුන් බව, 2019 අගෝස්තු 27 වැනි දිනැතිව පිළියෙල කළ කැබිනට් පත්‍රිකාවට අනුව, එක් පැමිණීමකට ඩොලර් 02 ක් අය කිරීමට සැලසුම් ක්‍රියාතමක වුවද දේශපාලන වෙනස් වීම් සහ අමාත්‍යාංශ වෙනස්වීම් හේතුවෙන් එය ක්‍රියාතමක කිරිමට නොහැකි වූ බව හා කොවිඩ් 19 අර්බුදයේදී සහ ඊට පෙර මහජනතාවට ලබා දුන් සේවය සැලකිල්ලට ගනිමින්, කැබිනට් තීරණය වෙනස් කර අරමුදල් ලබා දෙන ලෙස ඉල්ලා සිටි බව. | මේ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් සමඟ සාකච්ඡා කර ආයතනය බධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා සුදුසු යාන්ත්‍රනයක් ස්ථාපිත කළ යුතුය. |

## 1.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ගිලන් රථ සේවා ගාස්තු හා විවිධ පාර්ශවයන් වෙත කරන ලද ගෙවීම් | රු. 159,640,275 | බිල්පත්වල මුල් පිටපත් | කොවිඞ් 19 හේතුවෙන් ඇඳිරි නීතිය පැවති කාලයේ පිටපළාත් සේවකයින් හට ලබා දෙනු ලැබූ ආහාර වෙනුවෙන් මුල්පිටපත් ලබා ගැනීමට නොහැකි වූ බව, ගිලන් රථ සේවා කිරිම දිවයින පුරා සේවා ස්ථානවලින් සිදුකරන බැවින් මෙම තත්ත්වය උද්ගත වී ඇති බව සහ වර්තමානයේ මෙම තත්ත්වය නිවැරදි කිරිමට කටයුතු සිදුකර ඇති බව. | සියළු ගෙවීම් වෙනුවෙන් බිල්පත්වල මුල් පිටපත් ලබාගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 5 වැනි වගන්තිය සහ 2008 ජනවාරි 01 වැනි දින අංක 1530/13 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය | ඕනෑම මුදල් ලැබීම් හෝ ගෙවීම් අවස්ථාවකදීම රු.25,000 ට වැඩි වටිනාකම් වෙනුවෙන්ම රු.25 ක මුද්දර ගාස්තුවක් අයකළ යුතු වුවද, පදනම විසින් සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 707 කදී රු.550,539,511 ක් වූ ගෙවීම් වෙනුවෙන් මුද්දර ගාස්තු අයකර නොතිබුණි. | රුපියල් 25,000 ඉක්මවන සියලුම ගෙවීම් සඳහා මුද්දර ගාස්තු අඩු කිරීමට වර්තමානයේ අවශ්‍ය කටයුතු යොදා ඇති බව. | පනතේ විධිවිධානවලට අනුව මුද්දර ගාස්තු අයකළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 139(5) | වවුචර්වලට මුදල් ගෙවීමේදී ආදායකයාගේ අනන්‍යතාවය තහවුරු කර ගත යුතු වුවද, රු.6,464,100 ක් වූ වවුචර් 07 ක් සඳහා ගෙවීම් කිරීමේදී වවුචරය මතුපිට මුදල් භාරගත් බවට ආදායකයාගේ අත්සන හෝ මුදල් භාරගත් බවට කුවිතාන්සියක් හෝ ලබාගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කරන බව, කොවිඞ් වසංගතය පැවති කාලයේ ගෙවීම් වවුචර් කිහිපයක් ලබන්නා විසින් අත්සන් කර නොතිබුණ බව සහ එම කාලයේ සංචරණ සීමා පැවති බැවින් මහජනයාගේ පැමිණීම සීමා වී තිබුණු බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව, නිලධාරියෙක් වෙත කිලෝමීටරයට රු.2.00 ක සැතපුම් කුලියක් ගෙවිය හැකි නමුත්, එම විධිවිධානවලට පටහැනිව හා | දිස්ත්‍රික් භාර නිලධාරීන් ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා තමන්ගේම වාහන භාවිතා කරන බව, එවැනි චාරිකා | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු අතර ආයතන |

| | | | | |
|---|---|---|---|---|
| | XIV පරිච්ඡේදයේ 9.1 වගන්තිය | ආයතන අධ්‍යක්ෂකගෙන් ලබාගත් විධිමත් අනුමැතියකින් තොරව, ගිලන් රථ සේවාව අධීක්ෂණ කටයුතු වෙනුවෙන් දිස්ත්‍රික් මට්ටමින් ස්ථානගත කර තිබුණු අධීක්ෂණ නිලධාරීන්ට ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සඳහා තම පෞද්ගලික යතුරුපැදිය භාවිතා කිරීමටත් ඒ සඳහා පදනම විසින් කිලෝ මීටරයකට රු.18 බැගින් ගෙවීමටත් 2021 ජූලි මාසයේ සිට කිලෝ මීටරයකට රු.23 බැගින් ගෙවීමටත් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව 2021 වර්ෂය තුළ අවස්ථා 131 කදී කිලෝමීටරයට රු.18 ක් බැගින් රු.3,897,216 ක් ගෙවා තිබුණු අතර 2021 ජූලි මාසයේ සිට කිලෝමීටරයට රු.23 බැගින් අවස්ථා 63 කදී රු.2,466,674 ක් ගෙවා තිබුණි. | සඳහා ඔවුන්ට ඉන්ධන දීමනාවක් නොගෙවන බව, ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කිලෝ මීටරයකට රු.2 ක ගමන් දීමනාවක් ගෙවීම ප්‍රායෝගික නොවන බව, දිස්ත්‍රික් භාර නිලධාරීන් සඳහා මෝටර් සයිකල් සඳහා ආයෝජනය කිරීමට සිදුවන බව, ඊට අමතරව ඉන්ධන, රක්ෂණ, ටයර්, බැටරි, නඩත්තු ආදී වියදම් දැරීමට සිදුවන බව හා පිරිවැය ඉතිරිකිරීම් සලකා බලමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගමන් දීමනා ලෙස කිලෝමීටරයකට රු.23 ක් ගෙවීමට අනුමත කළ බව. | අධ්‍යක්ෂකගෙන් ලබාගත් විධිමත් අනුමැතියකින් තොරව මෙවැනි දීමනා නොගෙවිය යුතුය. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.6 ඡේදය | කාර්තුමය වශයෙන් කාර්යසාධන වාර්තා පිළියෙල කර අදාළ අමාත්‍යාංශය වෙත සහ භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත සෑම කාර්තුවක්ම අවසානවීමට දින 30 කට පෙර යැවිය යුතු වුවද, පදනම විසින් එපරිදි කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අදාළ චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ඡේදය | අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් කරමින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද, පදනම විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | කොවිඞ් 19 වසංගතය හේතුවෙන් 2020 සහ 2021 වර්ෂවල ප්‍රසම්පාදන අවශ්‍යතා සීමිත වූ බැවින්ද, 2022 වර්ෂයේදී මෙහෙයුම් කටයුතු සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බැවින්ද, ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල නොකළ බව හා හදිසි මිලදී ගැනීම් පමණක් සම්මත ප්‍රසම්පාදන ක්‍රමවේදයන් අනුව සිදු කරන බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.51,365,905 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,443,011 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.54,808,916 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පදනමේ අළුත්වැඩියා හා නඩත්තු වියදම්, ඉන්ධන වියදම්, ගමන් හා වෙනත් දීමනා, ගිලන් රථ සඳහා අවශ්‍ය සැපයීම් වියදම්, සේවක සුභසාධන හා කාර්යාල පාරිභෝජන ද්‍රව්‍ය වියදම් සහ දේශීය ගමන් වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ මිලදී ගෙන තිබුණු ගිලන් රථ 25 ක් සුවසැරිය පදනම නමින් 2021 දෙසැම්බර් 30 දින ලියාපදිංචි කර පදනම වෙත සංකේතාත්මකව භරදී තිබුණි. නමුත් ගිලන් රථවල පැවතිය යුතු තාක්ෂණික පිරිවිතරයන් හෝ අනෙකුත් අවශ්‍යතාවයන් පිළිබඳව හෝ කිසිඳු සොයා බැලීමකින් තොරව මිලදී ගෙන තිබුණු බැවින් සපයනු ලබන සේවාවන්වලට ගැලපෙන පරිදි ගිලන් රථ වැඩිදියුණු කිරීම සඳහා වූ ඇස්තමේන්තු ගත පිරිවැය රු.49,250,000 ක් භාණ්ඩාගාරය විසින් ලබාදී නොතිබීම හේතුවෙන් 2022 මැයි 26 දින වන විටත් ගිලන්රථ 25 අදාළ වෙනස්කම් සිදුකිරීමකින් තොරව සැපයුම්කරු භාරයේ රඳවාගෙන තිබුණි. ඒ හේතුවෙන් ගිලන් රථවල වගකීම් කාලය ඒවා භාවිතයට ගැනීමට පෙරම අවසන්වීමේ අවදානමක් පවතින බවත්, ගිලන් රථවල ලියාපදිංචි සහතිකයට අනුව ඒවා ආනයන රේගු බදුවලින් නිදහස්ව තිබියදී ගිලන් රථයක විකුණුම් මිල රු.15,950,000 ක් වීම අසාමාන්‍ය තත්ත්වයක් වන බවත් නිරීක්ෂණය විය. | පදනමේ ඉල්ලීමකින් තොරව මෙම ගිලන්රථ ලබාදීම සිදු කළ බව, පූර්ව රෝහල් සත්කාරක සේවාවලට සුදුසු ආකාරයෙන් ගිලන් රථ අවශ්‍ය පරිදි සකස් කළ යුතු බව, ගිලන්රථ ප්‍රමිතීන්ට අනුව පිළියෙල කිරීම සඳහා අමතර ප්‍රතිපාදන ලබාදෙන බව දන්වා සිටියද ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවස්ථා කිහිපයකදී ඉල්ලා සිටියද මේ දක්වා ප්‍රතිපාදන නොලැබුණු බව, පූර්ව රෝහල් සත්කාර සේවාවලට අනුකූල වන පරිදි ගිලන්රථ සකස් නොකර මෙම වාහන ධාවනයට යෙදවිය නොහැකි බව හා ඒ සම්බන්ධව භාණ්ඩාගාරයට සහ අමාත්‍යාංශයට ලිපි මඟින් දන්වා ඇති බව. | අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර මේ සම්බන්ධයෙන් වහාම ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පදනමේ හදිසි ඇමතුම් මධ්‍යස්ථාන නිලධාරී (Emergency Medical Dispatcher) තනතුර සඳහා අනුමත කාර්ය මණ්ඩලය 80 ක් වූ අතර තනතුර සඳහා වූ ආරම්භක මූලික වැටුප රු.35,000 ක් විය. 2021 දෙසැම්බර් 31 දිනට තත්‍ය කාර්ය මණ්ඩලය 38 ක් වූ අතර ඌන කාර්ය මණ්ඩලය සඳහා නිලධාරීන් බඳවා ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. ඒ වෙනුවට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතියකින් තොරව නිලධාරීන් 50 දෙනෙකු මසකට රු.48,500 බැගින් ගෙවීමේ පදනම මත පුද්ගලික සමාගමකින් 2021 සැප්තැම්බර් 24 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලබාගෙන 2021 දෙසැම්බර් 31 දින දක්වා වූ මාස 03 සඳහා රු.10,094,752 ක් ගෙවා තිබුණි. | ප්‍රසම්පාදන කමිටුවේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත බාහිරින් ලබාගත් කාර්ය මණ්ඩලය බඳවාගෙන ඇති බව, කොවිඩ් 19 මෙහෙයුම් කටයුතු හේතුවෙන් දිනකට ලැබුණු දුරකථන ඇමතුම් දෙගුණයක් වූ බව, කාර්ය මණ්ඩලයට කොවිඩ් ආසාදනයවීම හා ආශ්‍රිතයින් නිරෝධායනයවීම හේතුවෙන් මෙම තීරණය ගත් බව, හදිසි ඇමතුම් මධ්‍යස්ථාන නිලධාරීන්ගේ මූලික වැටුප රු.35,000 වන අතර පැය 12ක් සේවයේ යෙදෙන බැවින් ඔවුන්ගේ සාමාන්‍ය දළ වැටුප රු.55,000 ක් බව සහ බාහිරින් ලබා ගත් සමාගමට ගෙවන ලද මුදල හදිසි වෛද්‍ය ඇමතුම් නිලධාරීන්ගේ දළ වැටුපට වඩා අඩු බැවින් මෙම තීරණය ගත් බව. | මෙම බඳවා ගැනීම් සඳහා විධිමත් අනුමැතිය ලබාගත යුතුය. |
| (ආ) | ඉහල කළමනාකරණ තනතුරක් වූ මූල්‍ය ප්‍රධානි (Head of Finance) තනතුර සඳහා නිලධාරියෙක් 2021 සැප්තැම්බර් 02 දින කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි. වසරකට වඩා කාලයක් සඳහා පුරප්පාඩුවී තිබුණු මෙම තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත්කර ගැනීමට 2022 මැයි 26 දින වන විටත් කටයුතු කර නොතිබුණි. එසේම බඳවා ගැනීමේ ආකර්ෂණය ඇතිකර ගැනීමේ අරමුණින් මූල්‍ය ප්‍රධානි තනතුර සහ තවත් තනතුරු දෙකක අනුමත තනතුරු නාමය වෙනස් කර බඳවාගෙන තිබුණු අතර ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | සම්මුඛ පරීක්ෂණ පැවැත් වුවද සුදුසුකම් ලැබූ නිලධාරියෙකු නොසිටි බැවින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත වසරක කාලපරිච්ඡේදයක් සඳහා උපදේශකයෙකු බඳවා ගත් බව සහ සිසුයෙන් වෙනස් වන ශ්‍රම වෙළඳපළ සඳහා බඳවා ගැනීමේ ආකාර්ෂණය ලබා ගැනීමේ අරමුණින් මෙම තනතුරු නාම වෙනස් කළද අනුමත ශ්‍රේණවල හා අනුමත වැටුප් වලම පවතින තනතුරු වන බව. | මෙම බඳවා ගැනීම සඳහා විධිමත් අනුමැතිය ලබාගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක PFD/RED/01/04/2014/01 දරන රාජ්‍ය මුදල් ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව දිගුකාලීන දැක්මක් සහිතව අදාළ පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද, පදනම විසින් ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2021 වර්ෂයේ කොවිඩ් වසංගතය හේතුවෙන් පදනම විසින් ඒ සඳහා කටයුතු කළ බව සහ 2022 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම විගණනය වෙත ඉදිරිපත් කර ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුය. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 සහ 2019 ජනවාරි 12 දිනැති අංක ඩීඑම්ඒ/1-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව පදනම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණු අතර අභ්‍යන්තර විගණනයක් සිදුකරද නොතිබුණි. | ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් මෙම ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇති බව සහ 2022 වර්ෂයේදීද මෙම ඉල්ලීම පිළිබඳ අමාත්‍යාංශය හරහා කළමනාකරණ සේවා දෙපාර්මේනතුව වෙත දන්වා යවා තිබුණද මේ වන තෙක් ප්‍රතිචාර දක්වා නොතිබුණු බව. | අභ්‍යන්තර විගණනයක් සිදුකිරීමට කටයුතු කළ යුතුය. |

## 4.3 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය ප්‍රකාරව තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර “2030 න්‍යාය පත්‍රය” පිළිබඳව (පදනම ) නියාමන සභාව විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් තම විෂය පථය යටතට වැටෙන කාර්යයන් සම්බන්ධයෙන් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේ කොවිඩ් වසංගතය පැවතුණ බැවින් පදනමේ ප්‍රධාන අරමුණ වූයේ වසංගතය පාලනය කිරිම වෙනුවෙන් රජයට සහය වීම බව, වර්තමානයේ එම දර්ශක හඳුනාගෙන ඇති බව හා එම ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |